# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2299/28 - 2022 සැප්තැම්බර් මස 28 වැනි බදාදා - 2022.09.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**2012 අංක 22 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනතින් සංශෝධිත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66උ වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි**

දකුණු පළාත්, පළාත් පාලන දෙපාර්තමේන්තුවේ පළාත් පාලන කොමසාරිස් රනිල් වික්‍රමසේකර වන මම 2012 අංක 22 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනතින් සංශෝධිත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66උ වගන්තිය යටතේ ක්‍රියා කරමින් 2022.09.19 වැනි දින පෙ.ව. 10.00ට අම්බලන්ගොඩ නගර සභාවේ මහජන පුස්තකාල ගොඩනැගිල්ලේ උඩු මහලේ පිහිටි සභා රැස්වීම් ශාලාවේ දී (නගර සභාව ඉදිරිපිට ඇති ප්‍රධාන පුස්තකාලයේ) පැවති රැස්වීමේදී අම්බලන්ගොඩ නගර සභාවේ සභාපති වශයෙන් වැල්ලගේ කමල් ද සිල්වා මහතා තෝරා පත්කර ගත් බව මෙයින් නිවේදනය කරමි.

**රනිල් වික්‍රමසේකර,**
පළාත් පාලන කොමසාරිස්,
දකුණු පළාත.

2022 සැප්තැම්බර් මස 28 වන දින,
6 වන මහල, ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පිහිටි,
දකුණු පළාත්, පළාත් පාලන දෙපාර්තමේන්තුවේ දී ය.

EOG 09 - 0354


1A - PG 5985 — 08 (2022/09) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*